2020 . 01 . 23 අද                                                            පිටු. 11



# 2019 දෙසැම්බර් මස උද්ධමනය සැලකිය යුතු ලෙස ඉහළ ගිහින්

## ආහාර කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන් ඉහළ යෑම බලපායි

**සමීල පෙරේරා**

ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2013=100) ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2019 නොවැම්බර් මාසයේ පැවති 4.1% හි සිට 2019 දෙසැම්බර් මාසයේදී 6.2%ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේ.

ආහාර කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන්හි සිදු වූ ඉහළ යෑම් සහ 2018 දෙසැම්බර් මාසයේ පැවති පහළ පදනම් අගය හේතුවෙන් ඇති වූ සංඛ්‍යානමය බලපෑම මේ සඳහා හේතු වී ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව පෙන්වා දෙයි.

ඒ අනුව ආහාර කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය 2019 නොවැම්බර් මාසයේදී පැවති 4.0% සිට 2019 දෙසැම්බර් මාසයේදී 8.6%ක් දක්වා ශීඝ්‍ර ඉහළ යෑමක් පෙන්වා ඇති අතර, ආහාර නොවන කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය 2019 දෙසැම්බර් මාසයේදී 4.2%ක් ලෙස නොවෙනස්ව පැවතී ඇත.

මේ අතර වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි වෙනස, 2019 නොවැම්බර් මාසයේ පැවති 3.0% සිට 2019 දෙසැම්බර් මාසයේදී 3.5%ක් දක්වා ඉහළ ගොස් තිබේ.

එහිදී ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි මාසික වෙනස 1.6%ක් ලෙස වාර්තා වූ අතර, ඒ සඳහා හේතු වී ඇත්තේ 2019 දෙසැම්බර් මාසයේදී පැවති අයහපත් කාලගුණික තත්ත්වයේ බලපෑමෙන් ආහාර කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන්හි දක්නට ලැබුණු ඉහළ යෑම් පමණක් බව මහ බැංකුව කියයි. ආහාර කාණ්ඩයෙහි එළවළු, සහල්, රතු ලූනු, පොල් සහ මාළු මිල ගණන්වල ඉහළ යෑම් වාර්තා වී තිබේ. මේ අතර 2019 දෙසැම්බර් 01දා සිට බලපැවැත්වෙන පරිදි රජය විසින් ක්‍රියාත්මක කළ බදු පහළ දැමීම් හේතුවෙන් සන්නිවේදන; නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ වෙනත් ඉන්ධන; සෞඛ්‍ය; සහ විවිධ භාණ්ඩ හා සේවා යන උප කාණ්ඩයන්හි අයිතමවල මිල ගණන් පහළ යෑම මගින් ආහාර නොවන කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන්හි පහළ යෑමක් වාර්තා වී ඇත.

කෙසේ වෙතත් ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන මූලික උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2019 නොවැම්බර් මාසයේදී පැවති 5.5% සිට 2019 දෙසැම්බර් මාසයේදී 5.2% දක්වා පහළ ගොස් ඇත. කෙසේ වුවද වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2019 නොවැම්බර් මාසයේදී පැවති 5.6% සිට 2019 දෙසැම්බර් මාසයේදී 5.7%ක් දක්වා ඉහළ ගොස් තිබේ.